SRI LANKA EXPORT DEVELOPMENT BOARD
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை
MINISTRY OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

# 2026 Manila Fame ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සමගාමීව පැවැත්වෙන වෙළඳපොළ අධ්‍යයන හා ධාරිතා සංවර්ධන වැඩසටහන

## 2026 ඔක්තෝබර් 13 සිට 19 දක්වා - පිලිපීනයේ මැනිලා නුවර

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් පිලිපීනයේ මැනිලා නුවර පැවැත්වෙන Manila Fame 2026 ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට සමගාමීව 2026 ඔක්තෝබර් 13 සිට 19 දක්වා වෙළඳපොළ අධ්‍යයන (Market Exposure) හා ධාරිතා සංවර්ධන (Capacity Building) වැඩසටහනක් සංවිධානය කර ඇත.

මෙම වැඩසටහනේ අරමුණ වන්නේ ශ්‍රී ලාංකීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (SMEs) ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා සූදානම් කිරීම සහ ඔවුන්ගේ අපනයන ශක්‍යතාවය වර්ධනය කිරීමයි.

මෙම වැඩසටහන තුළ සහභාගීවන්නන්ට පහත සඳහන් අවස්ථා හිමි වේ.

- ජාත්‍යන්තර වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳ සෘජු අවබෝධයක් ලබාගැනීම
- නවීන මෝස්තර නිර්මාණ (Product Design) සහ නවෝත්පාදන පිළිබඳ දැනුම ලබාගැනීම
- සන්නාමකරණය (Branding) හා භාණ්ඩ ප්‍රදර්ශන ක්‍රමවේද පිළිබඳ අත්දැකීම් ලබාගැනීම
- ජාත්‍යන්තර ගැනුම්කරුවන් හමුවීම
- ව්‍යාපාරික ජාල (Business Networking) ගොඩනගා ගැනීම

**අයදුම් කළ හැක්කේ කාටද ?**
ජාත්‍යන්තර වෙළඳපොළට සැපයුම් කිරීමේ හැකියාව ඇති, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදන කළ හැකි පහත සඳහන් ක්ෂේත්‍රවල නිෂ්පාදකයින්, නිර්මාණකරුවන්, සෘජු හා වක්‍ර අපනයනකරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

- **ගෘහ භාණ්ඩ** (Furniture)
- **අත්කම් හා ත්‍යාග භාණ්ඩ** (Handicrafts & Gifts)
- **විලාසිතා උපාංග** (Fashion Accessories)
- **පරිසර හිතකාමී හා තිරසාර නිෂ්පාදන** (Sustainable & Eco-friendly products)
- **වෙනත් අදාළ නිෂ්පාදන** (Any other relevant products)
- **ගෘහ අලංකරණ හා ගෘහ අභ්‍යන්තර සැරසිලි** (Home Décor and furnishings)
- **ගෘහ භාවිත උපකරණ හා මේස භාණ්ඩ** (Housewares & tableware)
- **ජීවන රටාවට අදාළ නිෂ්පාදන** (Lifestyle products)
- **අභ්‍යන්තර නිර්මාණ හා සැරසිලි භාණ්ඩ** (Interior design & decorative items)

**සහභාගීත්ව වියදම්**

සහභාගීවන්නන් විසින් පහත සඳහන් සියලු වියදම් තමන් විසින් දරනු ලැබිය යුතුය.

**ගුවන් ටිකට්පත් | හෝටල් නවාතැන් | ආහාර | අභ්‍යන්තර ප්‍රවාහන වියදම් | අනෙකුත් සියලු ගමන් වියදම්**

ප්‍රතිපාදන අනුව, EDB හි අදාළ සහන යෝජනා ක්‍රම යටතේ තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ගුවන් ගමන් ගාස්තුවේ සහ අභ්‍යන්තර ප්‍රවාහන වියදම්වල කොටසක් සඳහා මූල්‍ය ආධාරයක් ලබාදීම සලකා බලනු ලැබේ.

**අයදුම් කරන ආකාරය**

අයදුම්පත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය වන www.srilankabusiness.com හි "Announcements" අංශයෙන් බාගත කළ හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත විද්‍යුත් තැපැල් ලිපින වෙත යොමු කළ යුතුය.
jayalath@edb.gov.lk පිටපත් (CC): cpo@edb.gov.lk, faheem@edb.gov.lk

නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ හැකිය.
අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සංවර්ධන අංශය,
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,
අංක 42, නවම් මාවත, කොළඹ 02

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය: 2026 ජූලි 10

වැඩි විස්තර සඳහා ජේ.එච්.ටී.කේ. ජයලත් මහතා අමතන්න, නියෝජ්‍ය අධ්‍යක්ෂ (EDB - CPO)
071-8041180 / 081-2233592 / 081-2201147

**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)**
**NDB - EDB ගොඩනැගිල්ල, අංක 42, නවම් මාවත, කොළඹ 02.**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**